**ශීර්ෂය 319 - සබරගමුව පළාත් සභාව - 2023**

**1. දැක්ම, මෙහෙවර හා කාර්යභාරය**

**1.1 දැක්ම**

සබරගමුව අනභිබවනීයත්වයට.

**1.2 මෙහෙවර**

සබරගමුව ජනතාවගේ අභිවෘද්ධිය සඳහා සියලුම සම්පත් ඵලදායීව හා ගුණාත්මකව කළමනාකරණය කිරීම තුළින් සබරගමුව අභිමානවත් පෙර ගමනකට.

**1.3 කාර්යභාරය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ හා 1987 අංක 42 දරන පළාත් සභා පනතේ විධිවිධාන පරිදි කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීම.

**2. වාර්ෂික මූල්‍ය ප්‍රකාශන**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

සබරගමුව පළාත් සභාව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 47,959.0 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 38,528.1ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.මිලියන 9,430.9 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 19.66ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2023 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 43,677.0 | 35,466.6 | 8,210.4 | 18.80 |
| මූලධන | 4,282.0 | 3,061.5 | 1,220.5 | 28.50 |
| එකතුව | 47,959.0 | 38,528.1 | 9,430.9 | 19.66 |

3. විගණන නිරීක්ෂණය

ශීර්ෂය යටතේ පාර්ලිමේන්තුව විසින් සලසා දුන් ප්‍රතිපාදන පළාත් සභාව විසින් පළාත් සභාවේ අරමුදල යටතේ ගිණුම්ගත කර උපයෝජනයන් සිදුකර තිබුණි. පළාත් සභා අරමුදල විගණනය කර ඒ පිළිබඳ විගණකාධිපති වාර්තාව යථා කාලයේ දී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.